2024.08.

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම 2024
## බුද්ධ ධර්මය
## 9 ශ්‍රේණිය

විභාග අංකය/නම ..............................

කාලය පැය 02 යි

Learning Resource Center
De Mazenod College
Kandana

### I කොටස

❖ අංක 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සැදැහැතියන් විසින් දැක සංවේග උපදවා ගත යුතු ස්ථාන හතරක් පිළිබඳව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ සේක. එම ස්ථාන හතර පිළිවෙළින් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

1. ලුම්බිණි සල් උයන, බුද්ධගයාව, ඉසිපතන මිගදාය, උපවත්තන සල් උයන
2. ලුම්බිණි සල් උයන, ඉසිපතන මිගදාය, උපවත්තන සල් උයන, බුද්ධගයාව
3. බුද්ධගයාව, ලුම්බිණි සල් උයන, ඉසිපතන මිගදාය, උපවත්තන සල් උයන
4. ඉසිපතන මිගදාය, බුද්ධගයාව, ලුම්බිණි සල් උයන , උපවත්තන සල් උයන

02. බුදුන් වහන්සේට දානය පවා නොමැතිව වැඩ වාසය කරන්නට සිදු වූයේ,

1. බේළුව නම් ගමෙහි වැඩ සිටියදී ය.
2. විශාලා මහනුවර වැඩ සිටියදී ය.
3. රජගහනුවර වැඩ සිටියදී ය.
4. වේරංජාවේ වැඩ සිටියදී ය.

03. "මහණෙනි මට හිත ඇති සැම කෙනෙක්ම මෙම ධර්මාරාම තෙරුන් ආදර්ශයට ගත යුතුය. මල් සුවඳ ආදියෙන් මා පුදන්නෝ නිසි ලෙස මා පුදන්නෝ නොවෙති. ධර්මානුකූලව පිළිවෙත් පුරන්නෝ ම මා පුදන්නෝ වෙති." මෙයින් බුදුන් වහන්සේ අපට උගන්වා ඇත්තේ,

1. ආමිස පූජාවට වඩා බෝධි පූජාව උතුම් බවය.
2. ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව උසස් බවය.
3. ප්‍රතිපත්ති පූජාවට වඩා ආමිස පූජාව උසස් බවය.
4. බුදුන් පුදන්නට සුදුසුම වන්නේ මල් පූජාව බවය.

04. බුදුරදුන් වැඩසිටියදීම පැවිදිව රහත් වූ අන්තිම රහත් ශ්‍රාවකයා වීමේ භාග්‍ය උදාකර ගත්තේ,

1. පුක්කුස හිමි ය.
2. ආනන්ද හිමි ය.
3. අස්සජි හිමි ය.
4. සුභද්‍ර හිමි ය.

05. සුනීත, සෝපාක, රජ්ජුමාලා, මට්ටකුණ්ඩලී යන අයගේ කතා පුවත් තුළින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවැති,

1. ඍජු ගුණයයි.
2. මහාකාරුණික ගුණයයි.
3. අකම්පිත ගුණයයි.
4. යථාවාදී තථාකාරී ගුණයයි.

06. "භවත්නි, මහණ ගොයුම්හු වූ කලී විශිෂ්ට රූප සම්පත් ඇත්තෝ ය. දැකුම් කටයුතු ය. ප්‍රසාදජනක ය." යනාදී වශයෙන් බුදුරජාණන් වහන්සේගේ ආකර්ශණීය රූප විලාසය පිළිබඳ වර්ණනා කළේ,

1. සෝණදණ්ඩ බමුණා ය.
2. කොසොල් රජතුමා ය.
3. භාරද්වාජ බමුණා ය.
4. සර්වමිත්‍ර බමුණා ය.

07. මෙලොව පරලොව සැපත පිණිස පිළිගන්වනු ලබන සියලු දාන පිළිගැනීමට සුදුසු වන හෙයින් මහා සංඝරත්නය,

1. සාමීචිපටිපන්න වන සේක.
2. ආහුනෙය්‍යා වන සේක.
3. පාහුනෙය්‍යා වන සේක.
4. දක්ඛිණෙය්‍යා වන සේක.

08. මහා සංඝ රත්නය පිළිබඳ වර්ණනා කෙරෙන 'සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා' යන පද්‍ය සඳහන් වන ග්‍රන්ථය වන්නේ,

1. බුදුගුණාලංකාරය යි.
2. ලෝවැඩ සඟරාව යි.
3. ලෝකෝපකාරය යි.
4. කාව්‍යශේඛරය යි.

09. සම්බුදු සසුනෙහි අභිඥාලාභී භික්ෂුණීන් වහන්සේලා අතර අග්‍රස්ථානයට පත් වූයේ,

1. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ය.
2. උප්පලවන්නා තෙරණිය ය.
3. භද්දකච්චානා තෙරණිය ය.
4. පටාචාරා තෙරණිය ය.

10. ධම්ම පදයේ ඇතුළත් ගාථා සංඛ්‍යාව,

1. 325 කි.
2. 413 කි.
3. 420 කි.
4. 423 කි.

11. බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කොට ඇත්තේ,

1. අනුරාධපුර ජේතවන චෛත්‍යයේ ය.
2. අනුරාධපුර ථූපාරාම චෛත්‍යයේ ය.
3. මිහින්තලයේ සේල චෛත්‍යයේ ය.
4. බදුල්ල මුතියංගණ චෛත්‍යයේ ය.

12. අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇති වූවක් සේ සලකා සතුටට පත්වන ස්වභාවය හැඳින්වෙන්නේ,

1. මුදිතාව ලෙස ය.
2. මෙත්තාව ලෙස ය.
3. කරුණාව ලෙස ය.
4. උපේක්ඛාව ලෙස ය.

13. සිගාලෝවාද සූත්‍රයට අනුව ගිහියා විසින් පැවිදි උතුමන් කෙරෙහි ඉටු කළ යුතු යුතුකමක් නොවන්නේ,

1. මෛත්‍රියෙන් ක්‍රියා කිරීමයි.
2. මෛත්‍රී සහගතව කතා කිරීමයි.
3. යහපත් සිතින් ආශිර්වාද කිරීමයි.
4. සිව් පසයෙන් උවටැන් කිරීමයි.

14. නිවන් මඟෙහි අත්තිවාරම හෙවත් පදනම ලෙස සැලකෙන්නේ,

1. භාවනාවයි.
2. සමාධියයි.
3. ප්‍රඥාවයි.
4. සීලයයි.

15. 'ශ්‍රී බුද්ධ රශ්මි" නමින් පුවත්පතක් ආරම්භ කරමින් අන්‍යාගමිකයන්ගේ විවේචනවලට පිළිතුරු දීමට කටයුතු කළේ,

1. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ය.
2. බලන්ගොඩ ආනන්ද මෛත්‍රී හිමියන්ය.
3. දෙණිහේනේ ශීලානන්ද හිමියන්ය.
4. දාමහන ධම්මානන්ද හිමියන්ය.

16. ලක්දිව ආගමික, සංස්කෘතික, සාමාජික හා ජාතික නවෝදයේ ප්‍රබලතම සාධකය ලෙස සැලකෙන්නේ,

1. මහින්දාගමනය යි.
2. සහජීවනය යි.
3. සමානාත්මතාවය යි.
4. ජාතිකාභිමානය යි.

17. ත්‍රිවිධ ශික්ෂාව යනු,

1. සිත, කය, වචනය ය.
2. අනිත්‍ය; දුක්ඛ, අනාත්ම ය.
3. සීල, සමාධි, ප්‍රඥාව ය.
4. බුදු, පසේ බුදු, මහරහත් ය.

18. පව් කිරීමට ඇති ලජ්ජාව හා බිය හැඳින්වෙන්නේ,

1. හිරි ඔත්තප්ප ලෙස ය.
2. ත්‍රිකෝටි පාරිශුද්ධිය ලෙස ය,
3. සිවු බඹ විහරණ ලෙස ය.
4. භාවනාව ලෙසය.

19. දුකට මුල්වන්නා වූ තෘෂ්ණාව මුළුමනින් නැසීමක් වේද, අත්හැරීමක් වේද, දුරලීමක් වේද, මිදීමක් වේද, එහි නොඇලීමක් වේද, එය,

1. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව සත්‍යය යි.
2. දුක්ඛ ආර්ය සත්‍යය යි.
3. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය යි.
4. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය යි.

20. කරණීය මෙත්ත සූත්‍රයෙහි 'සන්තුස්සකෝ' යනුවෙන් හැඳින්වෙන්නේ,

1. පහසුවෙන් පෝෂණය කළ හැකි බව ය.
2. ලද දෙයින් සතුටු වීම ය.
3. අසීමිත අපේක්ෂා නැති බව ය.
4. සැහැල්ලු පැවතුම් ඇති බව ය.

(ලකුණු $20 \times 2 = 40$)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමු ප්‍රශ්නය ද ඇතුළත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01.

i සඟ ගුණ 2ක් ලියන්න.
ii ස්තූප තනා පිදිය යුත්තන් සිව් දෙනෙකි. ඒ අතරින් දෙදෙනෙකු නම් කරන්න.
iii භාවනාව ප්‍රගුණ කිරීමේ දී ගැහැණු දරුවන් වාඩි විය යුතු ක්‍රමය කුමක්ද?
iv සතර අගතිය අතුරින් 2ක් ලියන්න.
v බුදු රදුන් විසින් අෂ්ට ගරු ධර්ම දේශනා කළේ කාටද?
vi අටලෝ දහම අතරින් 2ක් නම් කරන්න.
vii බුදුන් වහන්සේට අවසන් දානය පූජා කළේ කවුරුන් විසින්ද?
viii චූලෝදර මහෝදර නාග දමනය පිණිස බුදුරදුන් වැඩි ස්ථානය කුමක්ද?
ix පංච නීවරණ අතරින් 2ක් නම් කරන්න.
x දුක්ඛ ආර්ය සත්‍යය දේශනාවෙහි සඳහන් සසර වසන සත්වයාට විඳීමට සිදුවන දුක් අතරින් දෙකක් නම් කරන්න.

(ලකුණු 2x10=20)

02.

i බුද්ධ චරිතය තුළින් ප්‍රකට කෙරෙන නායකත්ව ලක්ෂණ දෙකක් ලියන්න.

ii බුදුන් වහන්සේගේ චරිතවත් බව පිළිබිඹු කෙරෙන නිදසුන් තුනක් ලියන්න.

iii බුදුරජාණන් වහන්සේගේ චරිතය තුල පැවති ආදර්ශමත් ලක්ෂණ දෙකක් ඇසුරින් ඔබගේ නායකත්ව ගුණාංග වර්ධනය කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 = 10 )

03.

i. සීලය යනු කුමක්ද?

ii. සීල ශික්ෂාවට ඇතුළත් වන මාර්ගාංග තුන ලියන්න.

iii. සිල්වත් වීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 = 10 )

04.

i. සමාජයේ යහ පැවැත්ම උදෙසා ම තමන්ගේ යුතුකම් හා වගකීම් ඉටු කිරීම පිළිබඳව කරුණු ඇතුළත් වන සූත්‍රය කුමක්ද?

ii. එම සූත්‍රයේ සඳහන් ස්වාමියා විසින් සේවක පක්ෂය වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.

iii. සේවා - සේවක යුතුකම් මනාව ඉටු නොවීමෙන් සමාජයේ ඇතිවන ගැටලු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2+3+5 = 10 )

05.

i. සුකරානි අසාධූනි... යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ අර්ථය ලියන්න.

iii. ඉහත ධම්මපද ගථාවේ අර්ථය ඇසුරින් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2+3+5 = 10 )

06.

i. අනුරාධපුර අටමස්ථානය අතරින් දෙකක් ලියන්න.

ii. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.

iii. වර්තමානයේ වන්දනාමාන කිරීමේ දී බොදු දරුවන් සිහි තබා ගත යුතු වැදගත් කරුණු පහක් ලියන්න.

(ලකුණු 2+3+5 = 10 )

07. පහත දී ඇති මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය

ii ආනාපානසති භාවනාව

iii සමානාත්මතාව

iv සිවු බඹ විහරණ

(ලකුණු 2 x 5 = 10)

REGISTRAR
De Mazenod College
Kandana.